


යාපනය ජේදුරුතුඩුව පොලිසියේ සේවය කරනා කොස්තාපල්වරුන් දෙදෙනෙකු, බාලවයස්කාරියක වීඩියෝවක් ඔස්සේ අවමානයට පත් කරන බවට බියවද්දා වසර දෙකක් තිස්සේ ලිංගික අපයෝජනයට ලක් කළ බවට පැවසෙන සිදුවීමක්, මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වී තිබිණි. එම සිදුවීම ආවරණය කළ පුවත් සිරස්තල කිහිපයක් මෙසේ දැක්විය හැක.

* දිනමිණ (ජන 05, 2023) - "වසර දෙකක් තිස්සේ දැරියක දූෂණය කිරීම: සැකකාර කොස්තාපල්වරයෙක් පොලිස් අත්අඩංගුවට"
* දිනමිණ (ජන 03, 2023) - "තරුණිය කෙලෙසූ පොලිස් ඩ්‍රැකියුලා අත්අඩංගුවට"
* මව්බිම (ජන 03, 2023) - "වසර 2 ක් තිස්සේ සිසුවියක අපයෝජනය කළ යාපනයේ PCලා 2ක් ගැන විමර්ශනයක්"

ඔබ සිතන ලෙසට,

1) ලිංගික අපරාධයන්, ලිංගික අපයෝජනයන් දැක්වීමට සිදුවීමට ලක් වූ අය අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය කරන "කෙලෙසීම" හෝ "දූෂණය" වැනි යෙදුම් භාවිතා කිරීම අයෝග්‍ය නොවන්නේ ද?

2) "කෙලෙසීම" හෝ "දූෂණය" වැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයකට ලක් වූ අයෙකු පිළිබඳව සමාජය තුළ කොන් කිරීමක් ඇති කිරීමට හේතු නොවනු ඇති ද?

3) එසේ නම්, මෙවැනි සිදුවීමක් හැඳින්වීමට වඩාත් යෝග්‍ය වන්නේ, "ලිංගික අපයෝජනය", "ලිංගික අපරාධය" වැනි යෙදුම් නොවන්නේ ද?

4) "තරුණිය කෙලෙසූ පොලිස් ඩ්‍රැකියුලා අත්අඩංගුවට" යනුවෙන් වන දිනමිණ සිරස්තලය පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google ෆෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.